සැ. යු.- 2011.02.18 දින පළවූ අංක 1694 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,695 - 2011 පෙබරවාරි මස 25 වැනි සිකුරාදා - 2011.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 285 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 මාර්තු මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 පෙබරවාරි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

283- B 80200— 9,040 (2011/02)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දුරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 මාර්තු මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011ක් වූ පෙබරවාරි මස 07 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | දෙවිනුවර | වැල්ලබඩ පත්තුව සහ කඩවත් සතර (තලල්ල) කොට්ඨාසයේ සාමාන්‍ය විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර. |

02-610

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2011 මාර්තු මස 25 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011ක් වූ පෙබරවාරි මස 07 වැනි දින,
බත්තරමුල්ල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 234/A3 හි
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | පාතහේවාහැට | හපුතලේ පල්ලේගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා පාතහේවාහැට විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | අකුරණ | උඩගම්පහ අංක 01 කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| | | හාරිස්පත්තුව විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | හාරිස්පත්තුව | කුළුගම්මන සිය පත්තුව අංක 02, කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා හාරිස්පත්තුව විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | පාතහේවාහැට | ගම්දහය දකුණ අංක 02 උප්පැන්න, මරණ හා පාතහේවාහැට විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | මිනිපේ හසලක | කන්දපහල දකුණ උප්පැන්න, මරණ හා උඩුදුම්බර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |
| මහනුවර | උඩුනුවර | යටිනුවර උඩුනුවර කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

02-611

---

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක තනතුරු සඳහා පුහුණුවට සිසුන් බඳවා ගැනීම - 2011

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික තනතුරු සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසි ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයෙන් සහ කීට විද්‍යා සහකාර තනතුර සඳහා සිසුන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසි පුරුෂ පක්ෂයෙන් සහ පාසල් දන්ත චිකිත්සක තනතුර සඳහා සිසුවියන් බඳවා ගැනීම පිණිස සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසි ස්ත්‍රී පක්ෂයෙන් පමණක් ද අයදුම්පත් කැඳවනු ලැබේ.

01. 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අ. පො. ස. (උ. පෙළ.) විභාගයෙන් ලබා ගන්නා ලද Z අගය අනුව සකස් කළ ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කර ගනිමින් සුදුසුකම් ලැබූවන් අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක පාඨමාලාවන් සඳහා තෝරා ගනු ලැබේ.

02. අදාල පුහුණු පාඨමාලාවට බඳවාගත හැකි සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාතය පදනම් කර ගනිමින් සිසුන් පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ.

03. (i) මෙම පාඨමාලා පූර්ණකාලීන පාඨමාලාවන් බැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ වෙනත් පාඨමාලා හදාරන සිසුන් මෙම පාඨමාලාවන් සඳහා අයදුම් නොකළ යුතුයි.

(ii) කිසියම් දිනක ඔබ කුමන හෝ විශ්ව විද්‍යාලයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දින වන විට ඔබ විසින් එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. (ඔබ විශ්ව විද්‍යාලයක ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි වී නොමැති/නොවන අයෙක් වුව ද ඔබ විශ්ව විද්‍යාල සිසුවෙකු සේ සලකනු ලබන බැවින්, එම අයදුම්කරුවන් ද එම ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.).

(iii) ඔබ යම් විශ්ව විද්‍යාලයක උපාධිය සම්පූර්ණ කර සිටින අයෙක් නම් එම උපාධිය බලපැවැත්වෙන දිනය (Effective Date) අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට පෙර දිනයක් විය යුතු ය.

*සැළකිය යුතුය.*-ඉහත 03 II හා/හෝ 03 III අනුව ඔබ විසින් විශ්ව විද්‍යාල ලියාපදිංචිය අවලංගු කර ගන්නේ නම් හෝ දැනට උපාධිය සම්පූර්ණ කර සිටීනම් හෝ අනිවාර්යයෙන්ම ඔබ අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක පුහුණු පාඨමාලාව සඳහා ඇතුලත් කර ගන්නේය යන්න මෙම ගැසට් නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව ඔබ තරයේ සිහි තබාගත යුතු ය.

ලියාපදිංචිය අවලංගු කරගෙන හෝ උපාධිය සම්පූර්ණ කර හෝ තිබෙන නමුත් ප්‍රමාණවත් Z අගයක් ඔබ විසින් ලබාගෙන නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා සුදුසුකම් නොලබන බව ඔබ විසින් දැනගත යුතු ය.

එමෙන්ම, ඔබ විසින් ප්‍රමාණවත් Z අගයක් ලබාගෙන ඇති නමුත් ඉහත 03 I, 03 II සහ 03 III යන වගන්තිවල සඳහන් කරුණු ඔබ විසින් සම්පූර්ණ කිරීමට අසමත් වන්නේ නම්, කිසිදු අයුරකින් මෙම පාඨමාලාවන් සඳහා ඔබ සුදුසුකම් නොලබන බව ද ඔබ විසින් තවදුරටත් දැනගත යුතු ය.

04. අදාළ සියලුම පාඨමාලාවන් සඳහා පුහුණු කාලය වසර 2කි.

05. *අධ්‍යාපන සුදුසුකම් :*

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාව* | *අ. පො. ස. (සා. පෙළ.) සුදුසුකම්* | *අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම්* |
|---|---|---|---|
| 01. | අක්ෂි තාක්ෂණවේදී | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි භාෂාව යන විෂයන්ට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් සමත් විය යුතුය. (මෙයින් එක් | 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව විෂය සමත් වී තිබීම සහ විද්‍යා විෂය ධාරාවෙන් උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයන් |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ. පො. ස. (සා. පෙළ.) සුදුසුකම් | අ. පො. ස. (උ. පෙළ) සුදුසුකම් |
|---|---|---|---|
| | | වරකදී විෂයයන් 05කින් සමත් වී තිබිය යුතුය.) අක්ෂි තාක්ෂණවේදී තනතුර සඳහා ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් තිබීම අනිවාර්ය වේ. | අතරින් එක් විෂයක් ඇතුළුව විෂයන් 3කින් සමත් වී තිබිය යුතුය. (අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ z අගය ඇතුලත් කිරීම අනිවාර්ය වේ.) |
| 02. | දන්ත කාර්මික | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් හයකින් සමත්වීම | 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව ජීව විද්‍යා විෂය ධාරාවෙන් සමත්වීම සහ භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් එකක් ඇතුලුව විෂයන් තුනකින් සමත් වී තිබිය යුතු ය.<br><br>(අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ z අගය ඇතුලත් කිරීම අනිවාර්ය වේ.) |
| 03. | කීට විද්‍යා සහකාර | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් හයකින් සමත් විය යුතු ය. | 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව ජීව විද්‍යා විෂය ධාරාවෙන් සමත් වී තිබීම සහ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් දෙකක් ඇතුළුව විෂයන් 3කින් එකවර සමත්වී තිබිය යුතුය. (අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ Z අගය ඇතුලත් කිරීම අනිවාර්ය වේ.) |
| 04. | පාසල් දන්ත චිකිත්සක | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයෙන් සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් හයකින් සමත් විය යුතු ය. | 2007 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව විද්‍යා විෂය ධාරාවෙන් සමත්වීම සහ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, කෘෂි විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් අතරින් විෂයන් දෙකක් ඇතුලුව විෂයන් තුනකින් එකවර සමත් වී තිබිය යුතුය. (අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ z අගය ඇතුලත් කිරීම අනිවාර්ය වේ.) |

06. *අනෙකුත් සුදුසුකම් :*

(අ) 2011.03.25 දිනට වයස අවුරුදු 18ට නොඅඩු, වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුයි.

(ඇ) මනා ශාරීරික සෞඛ්‍යකින් යුක්ත විය යුතුයි.

(ඈ) අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික තනතුරු සඳහා ස්ත්‍රී, පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක.

(ඉ) කීට විද්‍යා සහකාර තනතුර සඳහා පුරුෂ පක්ෂයට පමණක් අයදුම් කල හැක.

(ඊ) පාසැල් දන්ත චිකිත්සක තනතුර සඳහා අයදුම්කරුවන් උස අඩි 4යි, අඟල් 10ට වැඩි අවිවාහක කාන්තා පක්ෂයේ අය විය යුතුයි.

(උ) තමන් අයදුම් කරන දිස්ත්‍රික්කය තුළ අවම වශයෙන් අවුරුදු තුනක් පදිංචිව සිටිය යුතුය.

(ඌ) අභ්‍යාසලාභී අපේක්ෂක, අපේක්ෂිකාවන්ට පාඨමාලාවන් තුනක් සඳහා අයදුම් කල හැකිවේ. අයඳුම් පත්‍රයේ තම මනාපය අනුපිළිවෙලට සඳහන් කළ යුතුවේ. මුල් පාඨමාලාව සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් අයදුම් කර ඇති අනෙක් පාඨමාලාව සඳහා සම්මුඛ පරීක්ෂණයන්ට කැඳවනු නොලැබේ. යම් හේතුවකින් එක් පාඨමාලාවකට වඩා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලැබුවහොත් මනාපය අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. කිසිම හේතුවක් නිසා මනාපය අනුව තෝරාගනු ලැබූ පාඨමාලාවන්හි වෙනසක් සිදු කරනු නොලැබේ. පාඨමාලාවකට ලියාපදිංචි වූ පසු වෙනත් පාඨමාලාවකට ප්‍රවිශ්ඨ වීමට අවස්ථාව දෙනු නොලබන අතර, ඒ සඳහා ඉල්ලුම් කිරීම හෝ නොකළ යුතු ය.

07. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික, කීට විද්‍යා සහකාර සහ පාසල් දන්ත චිකිත්සක යන තනතුරු එකකට වැඩි සංඛ්‍යාවකට ඔබ අයදුම් කරන්නේ නම් අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය. මේ සමඟ ඇති ආකෘතිපත්‍රය අනුව අයදුම්පත් සකස් කර ගතයුතුවේ. මේ සමඟ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, සෞඛ්‍ය අමාත්‍යාංශය, සුවසිරිපාය, 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 නමින් කොළඹ මහ තැපැල් කාර්යාලයෙන් ගෙවිය හැකි මුදල් ඇණවුමක් (Money Order) මඟින් රුපියල් 200ක ගාස්තුවක් සෑම අපේක්ෂකයෙකු විසින්ම ගෙවිය යුතු ය. මුදල් ඇණවුම අයදුම් පත්‍රය සමග අමුණා එවිය යුතු අතර, එම මුදල කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ.

(ආ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 2,40,360කට නොඅඩු වැටුපක් ලබන රජයේ නිලධාරියෙකු විසින් අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුවේ.

(ඇ) අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙලවරේ "අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික, කීට විද්‍යා සහකාර, පාසල් දන්ත චිකිත්සක යන තනතුරු සඳහා පුහුණුවට සිසුන් බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කොට 2011.03.25 දින හෝ ඊට පෙර "අධ්‍යක්ෂ(පාලන) අංක 02, සෞඛ්‍ය, අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

08. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

09. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

10. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. ඉහත අධ්‍යාපන සුදුසුකම් සහ අනෙකුත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂයන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේ දී අවශ්‍ය සහතික මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ අපේක්ෂකත්වය ප්‍රතික්ෂේප කරනු ලැබේ :

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ මුල් සහතික නිකුත් කර නැති විට බාහිර අයදුම්කරුවන්ට නිකුත් කළ ප්‍රතිඵල ලේඛනය හෝ අයදුම්කරු විභාගයට පෙනී සිටි විදුහලේ විදුහල්පතිවරයා නිකුත් කළ මුල් ලිපිය යනාදී ලිපි ලේඛන ;

(ඇ) විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අ. පො. ස. (උ. පෙළ) Z ලකුණු සහතිකය.

(ඈ) ජාතික හැඳුනුම්පත/ගමන් බලපත්‍රය හෝ රියැදුරු බලපත්‍රය.

(ඉ) පාසල් දන්ත චිකිත්සක අයදුම්කරුවන් සම්බන්ධයෙන් අවිවාහක බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු සහතිකය පිළිබඳව සම්මුඛ පරීක්ෂණයට කැඳවීමෙහි ලිපියෙහි සඳහන් කරනු ලැබේ.

(ඊ) දිස්ත්‍රික්කය තුළ අවුරුදු 03කට පදිංචිය සනාථ කිරීම සඳහා 2007, 2008, 2009 ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපත් අයදුම්කරුගේ නම ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව නොමැති නම්, ඔහුගේ දෙමවුපියන්ගේ නම් ඡන්දදායක ලැයිස්තුවේ සඳහන්ව තිබිය යුතු ය. එවැනි අයදුම්කරුවන් විසින් ඡන්දදායක ලැයිස්තුවේ සහතික කළ පිටපතට අමතරව ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම සේවා නිලධාරියාගෙන් ලබාගත් පදිංචිය සනාථ කිරීමේ, සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

12. *පුහුණු කිරීමේ පරිපාටිය :*

(අ) තෝරාගත් අයදුම්කරුවන් තමන් අයදුම්කරන පාඨමාලාවන් සඳහා අදාල පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරිය යුතුවේ.

(ආ) පුහුණුව සඳහා ඇතුළත් කරන සිසුන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත..

(ඇ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ පුහුණු පාසලෙහි විභාග හා නිවාස කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන සිසුන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකි වේ.

(ඈ) පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ සිසුන්ට මාසිකව දීමනාවක් ගෙවනු ලැබේ. මීට අමතරව ජීවන වියදම් දීමනාව ද හිමිවේ.

(ඉ) පුහුණු පාසලට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව පත්වීම් ලැබුවහොත් අවම වශයෙන් අවුරුදු 10ක කාලපරිච්ඡේදයක් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට එළඹිය යුතු ය. පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැරගිය හොත් හෝ ඉහත (ඇ) ඡේදය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් පුහුණු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව හා රජය විසින් දරන ලද වියහියදම් සඳහා වැයවූ මුදල ඔහු/ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුවේ. එසේ නොවුවහොත් ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට නිසි පියවර ගනු ඇත.

13. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :*

පුහුණුව අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට ද රජය බැඳී නොසිටී. එහෙත්, දිවයිනේ පවතින පුරප්පාඩු මත අවසන් පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයන්ට දෙපාර්තමේන්තුව මගින් ඔවුන් ලබා ඇති කුසලතාවය පදනම් කර ගනිමින් අදාළ තනතුරේ III ශ්‍රේණිය තනතුරු සඳහා පත් කරනු ලැබේ. මුල් පත්වීමේ සිට වසර දෙකක් පත්වීමේ මුල් ස්ථානයේ රැඳී සිටීම අනිවාර්ය වේ.

14. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍ර පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම ලැබීමෙන් පසු යටකී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් ඒ දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/සේවයෙන් පහකරන අතර, නැවත රජයේ සේවයට නොගන්නාවූන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

15. තෝරාගත් අයදුම්කරු/අයදුම්කාරිය අදාළ පාඨමාලාවන් හැදෑරීමට සහ ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික සහ මානසික වශයෙන් යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් පුහුණු පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

16. ඉහත පරිදි බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින්වර පනවනු ලබන නීතිරීති හා නියෝගයන්ට ද යටත්වනු ඇත.

17. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන යම් ගැටළු සහගත කරුණක් උද්ගත වුවහොත් ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2011 පෙබරවාරි මස 07 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය,"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

අයදුම්පත්‍රය

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

***අතුරු වෛද්‍ය සේවාවේ අක්ෂි තාක්ෂණවේදී, දන්ත කාර්මික, කීට විද්‍යා සහකාර සහ පාසල් දන්ත චිකිත්සක තනතුරු සඳහා පුහුණුවට සිසුන් බඳවා ගැනීම - 2011***

01.

| ඔබ අයදුම් කරන පාඨමාලාව | සංකේත අංකය |
|---|---|
| | |

02. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

03. තැපැල් ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

04. (i) ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

(ii) දිස්ත්‍රික්කය :

(iii) ඔබ මෙම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවෙක් ද ? ඔව්/නැත

(iv) "ඔව්" නම් කොපමණ කලක පටන් ද?

05. උපන් දිනය : වර්ෂය :———, මාසය :——, දිනය :——.

2011.03.25 දිනට වයස : අවුරුදු :———, මාස :——, දින :——.

06. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ කොටුවේ '✓' යොදන්න)

| | |
|---|---|
| ස්ත්‍රී | |
| පුරුෂ | |

07. උස : අඩි :————., අඟල් :————.

08. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද ? යනවග (අදාල කොටුවේ '✓' යොදන්න)

| | |
|---|---|
| ඔව් | |
| නැත. | |

09. ජාතික හැඳුනුම්පත් අංකය :————.

10. විවාහක/අවිවාහක බව :————.

11. අධ්‍යාපන සුදුසුකම් :————.

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, (විද්‍යා විෂයයන් පමණි.) (ලකුණු සටහන් පිටපත අමුණන්න.)
විභාගයට ඉදිරිපත් වූ දිනය :————.
වර්ෂය :————. විභාග අංකය :————.
Z ලකුණ :————.

| *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|
| 01. | |
| 02. | |
| 03. | |
| 04. | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :
පළමු වාරය :
වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12. | |

දෙවන වාරය :
වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ශ්‍රේණිය* | *විෂයය* | *ශ්‍රේණිය* |
|---|---|---|---|
| 01. | | 07. | |
| 02. | | 08. | |
| 03. | | 09. | |
| 04. | | 10. | |
| 05. | | 11. | |
| 06. | | 12 | |

12. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද? (අදාළ කොටුවේ '✓' යොදන්න.)

| | |
|---|---|
| ඔව් | |
| නැත. | |

"ඔව්" නම් විස්තර සපයන්න. :————.

13. මුදල් ඇණවුම් අංකය :————.

14. අයදුම්කරුගේ සහතිකය :

(අ) මම වෙනත් කිසිඳු පූර්ණ කාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත්, මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) මා විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශන අසත්‍ය බව ඔප්පු වුවහොත් මා පුහුණුවට නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............... මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2011 ............... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

දිනය :————,
සහතික කරන නිලධාරියාගේ -
සම්පූර්ණ නම :————,
තනතුර :————,
ලිපිනය :————,
නිල මුද්‍රාව :————.

02-551